02 බොදු සිරිත් පිළිපැද වෙමු අපි සොඳුරු දරුවන්

බුද්ධ චරිතය ඉගෙනීමේ එක් අරමුණක් වනුයේ, බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් අපේ ජීවිතයට ගත හැකි ආදර්ශ මතු කර ගෙන අපේ ජීවිතය ගොඩනංවා ගැනීමයි. ශිෂ්‍යයකු, ගුරුවරයකු, නායකයකු ආදි ඕනෑ ම අයකුට බුදුසිරිතෙන් ලබා ගත හැකි උතුම් ආදර්ශ අපමණ ය. එම උදාර ආදර්ශ අතර, බුදුරජාණන් වහන්සේගේ ආචාරශීලීබව අතිවිශිෂ්ට ය. එය උදාර පුද්ගල චරිතයක් පමණක් නොව ප්‍රියශීලී ආදර්ශවත් සමාජයක් ගොඩනගා ගැනීමට ද බෙහෙවින් ඉවහල් වේ.

මෙවර අප විද්‍යාලයේ පෙර පොහොය වැඩසටහන වෙනුවෙන් "බුද්ධ චරිතයෙන් පිළිබිඹු කෙරෙන ආචාරශීලී ගති පැවතුම්" යන තේමාව යටතේ දේශනයක් සංවිධාන කෙරිණි. ඒ සඳහා අප ආරාධනා කළේ, පාසලේ බෞද්ධ සංගමයේ ගරු අනුශාසක ගුරු පියාණන්ට ය. එතුමා කළ දේශනයේ සාරාංශය මෙසේ ය.

බුදුරජාණන් වහන්සේගේ චරිතයේ පිළිබිඹු වන ආචාරශීලී ගුණාංගයන්ගෙන් මෙහි දැක්වෙන්නේ කිහිපයකි.

1. සුහදශීලී කතාබහ
2. ආගන්තුක සත්කාරය
3. මහජන මතයට ගරු කිරීම
4. අල්පශබ්දතාව
5. නිහතමානි බව

1. සුහදශීලී කතා බහ

මහනෙල්	සුවඳ ම ය
කුඩ මසු පිළී	ගඳ ම ය
දෙකට එක	දිය ම ය
හොඳට නරකට දෙකට	කට ම ය

මේ පද්‍යය පැළැනේ සිරි වජිරඥාණ මහනාහිමියන් විසින් ලියන ලද්දකි. පුද්ගල භාෂණය කරණ කොටගෙන මුවින් මහනෙල් මල් සුවඳ විහිදීම හෝ පිළිගඳ වහනය

වීම හෝ තීරණය වන බව මෙම පද්‍යයෙන් අපට දෙන පණිවුඩයයි. බුදුරජාණන් වහන්සේ, යමකු තමන් වහන්සේ වෙත පැමිණියේ නම්, එසේත් නොමැති නම් තමන් වහන්සේ යම් තැනකට වැඩම කළේ නම්, ඒ සෑම අවස්ථාවක දී ම සුහදශීලීව, ආචාරශීලීව ඇසුරු කළහ; කතාබහ කළහ. රාජ පූජිත සෝණදණ්ඩ නම් බමුණාගේ ප්‍රකාශයෙන් ද අපට එය වටහා ගත හැකි ය.

"ඔහු පවසන්නේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ,

ඒහි සාගතවාදී ය - එන්න, ඔබේ පැමිණීම ඉතා හොඳයි කියා ආගන්තුකයන් පිළිගන්නා අයෙකි.

සඛිල ය - කනට සුව එළවන කථාබහ කරන්නෙකි.

සම්මෝදක ය - සතුටුසාමීචි කථා ඇත්තෙකි.

අබ්භාකුටික ය - නොකැමැත්තෙන් බැම හැකිළීම නොකරන්නෙකි.

උත්තානමුඛ ය - විවෘත කථා බහ ඇත්තෙකි.

පුබ්බභාසී ය - පළමුවෙන් ම කථා කරන්නෙකි යැයි" සෝණදණ්ඩ බමුණා ප්‍රකාශ කර සිටියේ තම බ්‍රාහ්මණ පිරිසට ය. එසේ ම සකුළුදායි පිරිවැජියා දිනක් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි පවසා සිටියේ, "ස්වාමීනි, අපි යම් කථාවකින් උනිමු නම් ඒවා භාග්‍යවතුන් වහන්සේට පසු වත් ඇසීමට දුර්ලභ නොවේ. ඔබ වහන්සේගේ අරුත්බර දේශනාව කරන්න" යනුවෙනි. මෙයින් පැහැදිලි වන්නේ අන්‍ය ආගමික පිරිස් පවා බුදුරදුන්ගේ අරුත්බර ප්‍රියශීලී කථාබහ අගය කළ බව ය. සත්‍ය වචනයට, ප්‍රිය වචනයට අසීමිත බලයක්, ශක්තියක් ඇත. අප ඒ බව අවබෝධ කර ගත යුතු වේ; හැමවිට ම සත්‍යවාදී ව ප්‍රිය තෙපුලෙන් ම අන්‍යයන්ට සංග්‍රහ කළ යුතු වේ. එය අපගේ දියුණුවට හේතු වේ. සිරිත් මල්දමේ එන මේ පද්‍ය දෙකෙන් ද එම උපදේශය ලබා දෙයි.

බොරු කීම කැත ම ය
ගැරඬි කුණටත් නොසම ය
ඇත්ත නම් කදිම ය
මෙලොව රජ සැපතටත් උතුම ය

කුණුසරුප නො කියනු
කේලම් වචන නො කියනු
විහිළු බොරු නො කියනු
ඇනුම් පද කිසිවෙකුට නො කියනු

2. ආගන්තුක සත්කාරය

තමන් හමුවීමට එන තැනැත්තා කවරකු වුව ද ආගන්තුකයකු වශයෙන් ඔහු සුහදව සතුටින් පිළිගැනීමත්, ඔහුට සත්කාර කිරීමත් ශිෂ්ට සම්මත දියුණු මිනිසුන්ගේ සිරිතයි. උතුමන්ගේ පරමාදර්ශයයි. එසේ පැමිණි රජුන්, බමුණන්, සිටුවරුන් මෙන් ම දුකට පත් ව සිටි ජනයා ද, වාදයෙන් වාදය නගා, ප්‍රශ්නයෙන් ප්‍රශ්නය අසා තමන් වහන්සේ වෙහෙසට පත් කරන අදහසින් පැමිණි මහණ බමුණන් ද ඉතා සුහද ව, කාරුණික ව පිළිගෙන විවෘත ව හා ප්‍රියශීලී ව කථා බස් කිරීම, සුවදුක් විමසීම එසේ ම ඔවුන්ගේ ගැටලු විසඳා දෙමින් දහම් දෙසීම ද බුදුරදුන්ගේ සිරිත විය. එසේ පැමිණි ගිහි පැවිදි ආගන්තුකයන්ට උන් වහන්සේ විසින් සංග්‍රහ කරන ලද්දේ රසයෙන් ද, හරයෙන් ද අනූන වූ ධර්මාවවාදයෙනි. ඔවුන් සතුටට පත් කිරීමේ හා නිසි මග පෙන්වීමේ අපූර්ව හැකියාවක් බුදුරදුන් වෙත පැවති බවට සූත්‍ර දේශනාවලින් බොහෝ නිදසුන් සැපයිය හැකි ය.

බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි මේදතලුම්ප නම් නියම් ගම පිහිටි ආරාමයෙහි වැඩ සිටිය දී පසේනදි කොසොල් රජතෙමේ උන් වහන්සේ හමු වීමට එහි පැමිණියේ ය. ආරාමවාසී භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් පරිදි රජතෙමේ වසන ලද දොර ඇති බුදුරදුන් වැඩ සිටි විහාරයේ ආලින්දයට නිහඬව ම පිවිස උගුර පාදා දොරට තට්ටු කළේ ය. බුදුරජාණන් වහන්සේ ඇතුළු කුටියෙහි වැඩ සිටි සේක. දොර විවර කර රජතුමන් පිළිගත් සේක. තමන් වහන්සේ විසින් ම දොර හැර බුදුරදුන් සුහදව කළ ඒ පිළිගැනීමෙන් රජතුමා බලවත් සතුටට පත් වූ සැටි පෙළ දහම මෙසේ සඳහන් කරයි.

සෝණදණ්ඩ බමුණෙකි. අගුරට චම්පා නුවර විසූ ඔහු මහ ධනවතෙකි. එසේ ම උගතෙකි. එකසිය විසි වයස් ඇත්තෙකි. රාජ්‍ය සම්මාන ලාභියෙකි. මේ ඔහු බුදුරදුන් පිළිබඳ ව කළ ප්‍රකාශයයි.

"ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මෙහි එන්නැයි, හමුවීමට එන ආගන්තුකයන් උණුසුම් ව පිළිගනිති, කනට සුව දෙන වදන් තෙපළති, සතුටු සාමීචි කථා බස් කරති, බැම හකුළුවා රළු මුහුණ නොපෙන්වති, කරුණු සහිත ව ම කථා කරති."

"තව ද ඒ භාග්‍යවතුන් වහන්සේ මිහිරි යහපත් වදන් කථා කරති. මැනවින් කරුණු දක්වති. දියුණු මිනිසුන්ගේ වචන ම කියති. පිළිගත හැකිදේම තෙපළති. කෙළතොලු නොවෙති. ඒ වචන මැනවින් අරුත් මතු කරන්නේ ය. මට සිලිටිය."

සූත්‍රාන්තයන්හි සඳහන් තොරතුරු අනුව ඇතැම් දූන උගත් පඬිවරු බුදුරදුන් යම් නියම් ගමකට වැඩමවන පුවත අසා කලබල වූහ. තමන්ගේ පාණ්ඩිත්‍යය බුදුරදුන් වැඩම කළ පසු යටපත් ව යනු ඇතැයි සිතූ ඔවුහු උන් වහන්සේ සමග වාද

කිරීමට සැරසුණෝ ය. පසු ව ඔවුන් බුදුරදුන් වෙත පැමිණියේ ප්‍රශ්නයෙන් ප්‍රශ්නය අසා උන් වහන්සේ පැරදවීමේ අදහසිනි. එහෙත් උන් වහන්සේ විසින් එම පඬිවරු ඉතා නිහතමානි ව, සුහද ව, කාරුණික ව පිළිගන්නා ලදි. එසේ ම සුහද පිළිසඳර කථා බහද සිදුවිය. ඔවුහු කිසිදු ප්‍රශ්නයක් නොඇසූහ. කෙසේ නම් උන් වහන්සේ සමග වාද කරන්නේ දැයි සිතූ ඔවුහු උන් වහන්සේගේ ම ශ්‍රාවකයන් බවට පත් වූහ.

එක් සමයෙක බුදුරජාණන් වහන්සේ රජගහ නුවර සීත වනයෙහි වැඩසිටිය දී උන් වහන්සේ දැක ගැනීමේ බලවත් කැමැත්තෙන් රැය නිදි නොලබා ම ඇවිද ආවේ ධනවත් සිටුවරයෙකි. ඔහු අනාථපිණ්ඩික හෙවත් සුදත්ත සිටුතුමා ය. අළුයම තමන් හමුවට පැමිණි සිටුතුමා දුටු බුදුරජාණන් වහන්සේ "සුදත්ත මෙහි එන්නැ"යි නමින් ම අමතා පිළිගත්හ. භාග්‍යවතුන් වහන්සේ මා නමින් ම අමතන සේකැයි සිටුතුමා අතිශය සතුටට පත් විය.

සුභද්‍ර කුසිනාරාවෙහි විසූ පිරිවැජියෙකි. හෙට අළුයම බුදුරදුන් පිරිනිවන් පාන්නේ යයි ඔහුට අසන්නට ලැබිණි. දහම පිළිබඳ ව තමා තුළ ඇති සැකයක් දුරු කර ගැනීමට බුදුරදුන් හමුවීමට ඔහුට අවශ්‍ය විය. හෙතෙම උන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩ සිටි උපවර්තන සල් උයන වෙත ගියේය. එහෙත් බුදුරදුන් පත් ව සිටි අපහසු තත්ත්වය සැලකිල්ලට ගත් අනඳ තෙරණුවෝ සුභද්‍ර උන් වහන්සේ වෙත යැවීමට කැමැති වූයේ නැත.

"ඇවැත් සුභද්‍රයෙනි, භාග්‍යවතුන් වහන්සේ වෙහෙසට පත් නොකරන්න. උන් වහන්සේ ක්ලාන්ත ව වැතිර සිටිති" යි අනඳ තෙරණුවෝ පැවසූහ. මෙම කථා බහ බුදුරදුන්ට ඇසිණි. උන් වහන්සේ අනඳ තෙරණුවෝ ඇමතූහ.

"අනඳයිනි, කමක් නැ සුභද්‍ර වළක්වන්න එපා. ඔහුට මා හමුවීමට ඉඩ දෙන්න. ඔහු යමක් අසන්නේ ද මම පිළිතුරු දෙමි. සැක දුරු කරමි." යි වදාළහ. සුභද්‍ර බුදුරදුන් හමු විය. බුදුරජාණන් වහන්සේ ඔහුට දහම් දෙසන ලදි.

මෙසේ පිරිනිවන් මංචකයේ වැඩ හිඳිමින් පවා මහා කරුණාවෙන් ආගන්තුකයන් පිළිගෙන ඔවුන්ට ධර්මයෙන් සංග්‍රහ කිරීම බුදුරජාණන් වහන්සේගේ චරිතයෙහි විශිෂ්ට ලක්ෂණයකි. බොදු දරුවන් වන අප ද බුදුරජාණන් වහන්සේ ආදර්ශයට ගනිමින් ආගන්තුකයන් පිළිගෙන සුහද කථා බහෙන් ද කළ යුතු සංග්‍රහයෙන් ද ඔවුන් සතුටු කිරීමට පුරුදු විය යුතු ය.

3. මහජන මතයට ගරු කිරීම

අප අතර බොහෝ දෙනෙකුගේ ස්වභාවය නම් අනුන්ට සවන් නොදීම ය. අනුන් කියන දේ කොපමණ උතුම් වුව ද, සත්‍ය වුව ද, සාධාරණ වුව ද එයට සවන් නොදීම නොදියුණු මිනිසුන්ගේ ගතියකි. බුදුරජාණන් වහන්සේ නිබඳව ම මහජන මතයට සවන් දුන්හ.

මුල් කාලයේ බුදුරජාණන් වහන්සේ මෙන් ම භික්ෂූන් වහන්සේලා ද ගත කළේ සංචාරක ජීවිතයකි. උන් වහන්සේලාගේ වාසස්ථාන වූයේ, ආරණ්‍ය, රුක්මුල්, පර්වත, ගල්ලෙන්, සොහොන්, වනපෙත් වැනි ස්ථානයන් ය. දිනක් රජගහ නුවර සිටුවරයා භික්ෂූන් වහන්සේලාගේ ඉරියවු පැවතුම් කෙරෙහි ප්‍රසාදයට පත් වී 'ස්වාමීනී මා විහාරයක් කරවුවහොත් ඒ විහාරවල වාසය කරන්නාහු ද'යි උන් වහන්සේලාගෙන් විමසී ය. එවිට භික්ෂූන් වහන්සේලා "බුදුරජාණන් වහන්සේ අපට විහාර අනුදැන නැතැ"යි පැවසූහ. පසු ව සිටුතුමාගේ ඉල්ලීම පිළිගත් බුදුරජාණන් වහන්සේ විහාර වර්ග පහක් අනුමත කළහ. "විහාරය ද, සෙවිලි කළ ගෙය ද, ප්‍රාසාදය ද, සඳළු සහිත ගෙය ද, ගුහාව ද වශයෙනි." මේ අයුරින් ආරාම පිළිගැන්වීම ආරම්භ වූයේ ජනමතයට සවන් දීමක් වශයෙනි. ආරාම පිළිගෙන වැඩසිටිය ද වැසි කාලයේ දී බෞද්ධ භික්ෂූන් වහන්සේලා ළා දලු තණ පිඩලි මතින් පිඬු සිඟා යෑම, දහම් චාරිකාවේ යෑම දුටු පරම අවිහිංසාවාදය අගය කළ අන්‍ය ආගමික පිරිස් විවිධ දෝෂාරෝපණ එල්ල කළහ. මේ ජන මතයට සවන් දුන් බුදුරජාණන් වහන්සේ, වස්සාන සෘතුවේ දී උපසපන් භික්ෂූන්ට වස් සමාදන් වන ලෙස පනවා වදාළහ. ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම මත භික්ෂූන් වහන්සේලාට අතිරේක ගෘහපති චීවරය පිළිගැනීමට අවසර දීම ද මේ පිළිබඳ තවත් නිදසුනකි. භික්ෂූන් වහන්සේට අවශ්‍ය වැසිසළු, ගිලන් බෙහෙත්, ආගන්තුක බත් ආදිය අනුදැන වදාළේ විශාඛාවන් විසින් කරන ලද මෙවැනි ම ඉල්ලීමක් නිසා බව මහාවග්ගපාලි නමැති විනය පොතෙන් අපට කියවිය හැකි ය.

බුදුරදුන් ජනමතයට සවන් දුන් ඉතා සංවේදී අවස්ථාවක් අපට මහාවග්ගපාලියෙහි දී දැක ගත හැකි ය. බුදුරජාණන් වහන්සේගේ පියමහ රජු වූ සුදොවුන් රජුගේ මුනුබුරු රාහුල කුමරුගේ පැවිද්දෙන් අනතුරුව බලවත් පීඩාවට පත් විය. තමන් මෙරටෙහි රජු ය, ශාක්‍ය පරපුරෙහි වැඩිහිටියා ය යන වග පවා ඔහුට අමතක විය. ඔහු ඉතා සංවේගයෙන් බුදුරදුන් අභිමුඛයට ගොස් දරුවන් කෙරෙහි පියවරුන් තුළ ඇති පිය සෙනෙහස කියා පෑවේ ය; එසේ ම දෙමාපියන්ගේ අවසරයකින් තොර ව දරුවන් පැවිදි නොකරන ලෙස ද ආයාචනයක් කළේ ය. පියමහ රජුට සවන් දීමක්, ගරු කිරීමක් වශයෙන් බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම පිළිගෙන, දෙමාපිය අවසරයකින් තොර ව දරුවන් පැවිදි නොකරන ලෙස ශික්ෂාවක් ද පැනවූ සේක.

අනෙකාගේ බසට සවන් දීම, අවනත වීම, අන්‍ය මත ඉවසීම ඉතා උසස් ගුණාංගයකි. විශේෂයෙන් අප ගුරු බසට, දෙමාපිය බසට, වැඩිහිටි බසට මෙන් ම පූජ්‍ය උතුමන්ගේ බසට ද අවනත විය යුතුයි. ඔවුහු දන උගත්කමින් ගුණ නුවණින් සුපෝෂිත වූවාහු ය. ඔවුන්ගේ බසට අවනත වීමෙන් අපගේ ඥානය වර්ධනය කර ගන්නට හැකියාව, අවස්ථාව උදාවේ.

ගුරු බස	සැබෑ ම ය
එය පිළිගැනුම	යුතු ම ය
පඬි බසත්	එය ම ය
එයින් දෙලොවෙහි මහත්	සැප ම ය

(සිරිත් මල්දම)

4. අල්පශබ්දතාව

අපගේ ජීවන පැවැත්ම අන්‍යයන් හා නිරන්තරයෙන් බැඳී පවතී. එම නිසා අන් අයට කරදර පීඩා වන ලෙස උස් හඬින් කතා කිරීම, අනවශ්‍ය ලෙස කෑ කෝ ගැසීම මෙන් ම මහා හඬින් සිනාසීම ආදි සෑම දෙයක් ම ආචාර ධර්මයන්ට පටහැනි වූ ක්‍රියා ය. එම නිසා ආචාරශීලී පිරිසක් වීමට නම්, අප පුරුදු පුහුණු කර ගත යුතු උතුම් සමාජ ආචාර ධර්මයකි, අල්පශබ්දතාව, බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් ම අල්පශබ්දතාව අගය කළ ශාස්තෘවරයාණ කෙනෙකි. දිනක් බුදුරදුන් හමුවට සැරියුත් මුගලන් දෙනම සමගින් ආධුනික භික්ෂු පිරිසක් පැමිණියෝ ය. ඔවුහු බුදුරදුන්ගේ ගඳකිළිය අසල ඝෝෂා නගමින් හැසිරුණහ. බුදුරජාණෝ කෙවුලන් සේ මහත් ශබ්ද නගමින් කෑ ගසන්නේ කවුරුන් දැයි ආනන්ද හිමියන්ගෙන් විමසා එම ස්ථානයෙන් ඔවුනට බැහැර වන ලෙස දැන්වූ සේක. උන් වහන්සේ එපමණට ම නිශ්ශබ්දතාව අගය කළහ. වරක් සකුළුදායි පිරිවැජියාගේ අරමට වඩින බුදුරදුන් දක සකුළුදායි තම පිරිස නිහඬ කළේ, "භවත්නි, නිහඬ වන්න, ශබ්ද කරන්න එපා. මේ ශ්‍රමණ භවත් ගෞතමයෝ එති. ඒ ආයුෂ්මත්හු නිහඬ බව කැමැති වෙති. නිහඬ බවේ ගුණ කියති. පිරිස නිශ්ශබ්ද ව සිටින බව දැන ගතහොත් උන් වහන්සේ මෙහි වැඩම කරාවි"යි යනුවෙන් ප්‍රකාශ කරමිනි. වෙනත් ආගමිකයන් පවා බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාව අගය කළ උත්තමයකු ලෙස පිළිගත් ආකාරය මෙයින් පැහැදිලි වෙයි. වරෙක බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට කළ අවවාදයක සඳහන් වන්නේ, රැස් වූ භික්ෂූන් විසින් දැහැමි කතාවෙන් හෝ ආර්ය තුෂ්ණීම්භාවයෙන් වාසය කළ යුතු බවයි. කථාව, ඝෝෂා කිරීම තුළින් ඇතැම් විට අන්‍යයන්ගේ ගැරහීමට, උපහාසයට මෙන් ම කරදර විපත්වලට භාජන වීමට ද සිදු විය හැකි ය. එම නිසා අවශ්‍ය දේ අවශ්‍ය පමණට කථා කොට අනවශ්‍ය දේ බැහැර කොට නිහඬ ව වාසය කිරීමෙන් ඵලදායක ජීවිතයක් ගත කළ හැකි ය.

5. නිහතමානිබව

නිහතමානි යන්නෙන් අදහස් කරන්නේ මානය නැති බවයි. එය බුද්ධාදී උතුමන්ගේ පවත්නා ගුණයකි. සාමාන්‍ය පුද්ගලයන්ට ඇති කර ගත හැක්කේ අනතිමානි බවයි. අනතිමානි බව යනු අති මානයක් නැති බවයි.

බුදුරජාණන් වහන්සේ තුළ පැවති උතුම් ආචාරශීලී ගුණාංගයක් ලෙස නිහතමානිබව පෙන්වා දිය හැකි ය. බෝසත් චරිතයෙන් අනතිමානිබව පිළිබිඹු වෙයි. සිදුහත් කුමරු උද්‍යාන ක්‍රීඩාව සඳහා නික්ම යන අවස්ථාවෙහි ඔහු අතරමග දී දක්නට ලැබුණ පෙරනිමිති පිළිබඳ ව, ඡන්නගෙන් විමසී ය; ඒ පිළිබඳ ව ගැඹුරින් කල්පනා කළේ ය. කුමර අවදියෙහි දී ම උන් වහන්සේ උස් පහත් භේදය ප්‍රතික්ෂේප කළෝ ය; රියැදුරාගෙන් වුව ද අසා විමසා දැන ගැනීමට තරම් නිරහංකාර වූහ. බුදුරජාණන් වහන්සේ කොතෙක් නිහතමානි වී ද යත්, තම ශ්‍රාවක පිරිස් රැස් ව සිටි තැනකට පවා පිවිසියේ උගුරෙන් ශබ්ද කොට, දොරට තට්ටු කොට අවසර ලැබුණු පසු ව ය. උන් වහන්සේ උපස්ථාන ශාලාවට වැඩම කරන අවස්ථාවෙහි නන්දක තෙරුන් වහන්සේ ඉතා දීර්ඝ දේශනාවක් කරමින් සිටියහ. එම දේශනාව නිමා වන තුරු ම බුදුරජාණන් වහන්සේ එහි වැඩ සිටි අතර, දේශනාව නිමා වූ පසු උගුර පාදා දොරට සංඥා කොට දොර විවර වූ පසු ඇතුළට වැඩම කළහ. මේ හැම නිදසුනකින් ම අපට බුදු හාමුදුරුවන් තුළ පැවති නිරහංකාර, නිහතමානි ගති පැවතුම් ප්‍රදර්ශනය වන්නේ ය. බුදුරදුන් හමුවීමට දුර සිට පැමිණි තරුණ පුක්කුසාතිට උන් වහන්සේ හමුවනුයේ දෙදෙනා එක ම කුඹල් හලක රාත්‍රියෙහි වැතිර විවේක ගනිමින් සිටිය දී ය. තමන් වහන්සේ සොයා යන මේ තරුණ රජුට තමන් කවුරුන් දැයි ස්වයං වර්ණනාවක් නොකිරීමට තරම් උන් වහන්සේ නිරහංකාර වූහ. බුදුරජාණන් වහන්සේ තුළ පැවති මෙම නිහතමානි ගුණය විශේෂයෙන් ශිෂ්‍ය ජීවිතයේ දී ප්‍රගුණ කිරීම අපට ඉතා වැදගත් වේ. අපට කළ හැක්කේ අනතිමානි වීම ය.

සාරාංශය

ආචාරශීලී ගති පැවතුම් අනුගමනය කිරීම ප්‍රියශීලී උදාර ජීවිතයක් ගත කිරීමට උපකාරී වේ. ආදර්ශයට ගත හැකි එවැනි ආචාරශීලී ගති පැවතුම් රාශියක් බුද්ධ චරිතයෙන් පිළිබිඹු කෙරෙයි. සුහදශීලී කතාබහ, ආගන්තුක සත්කාරය, මහජන මතයට ගරු කිරීම, අල්පශබ්දතාව සහ නිහතමානිබව ඒ අතරින් කිහිපයකි. මේ උතුම් ගුණාංග සියල්ල අකාලික ගුණයෙන් යුක්ත ය. ඒවා අනුගමනය කිරීම තුළින් ප්‍රියශීලී උදාර ජීවිතයකට මාවත විවර වෙයි.

ක්‍රියාකාරකම

1. බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගති පැවතුම් පහක් නම් කරන්න.

2. එයින් එක් ගුණ ධර්මයක් පිළිබඳ ව ඡේදයක් ලියන්න.

පැවරුම

බුද්ධ චරිතයේ ආචාරශීලීත්වය පිළිබිඹු වන අවස්ථාවක් සිතුවමට නගන්න.